www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# *නිව් යෝක් ටයිම්ස්* පත්‍රය පාක්ලැන්ඩ් ශෝකාන්තය ගසා කන්නේ රුසියානු විරෝධී උද්ඝෝෂනය උත්සන්න කිරීමට ය

New York Times exploits Parkland tragedy to escalate anti-Russian campaign

**2018 පෙබරවාරි 21**

පාක්ලැන්ඩ් පාසලේ වෙඩි තැබීමෙන් දින හතරකටත් අඩු කාලයක දී, උසස් විද්‍යාල සිසුන් 17දෙනෙකුගේ ජීවිත බිලි ගත් ජාතික ශෝකාන්තයක් රුසියානු විරෝධී ප්‍රචාරයේ තම අනුකම්පා විරහිත උද්ඝෝෂනය තීව්‍ර කිරීමේ අවස්ථාවක් බවට හැර වීමට *නිව් යෝක් ටයිම්ස්* පත්‍රය පොටක් පාදා ගෙන ඇත්තේ, ප්‍රතිගාමී බොරු හා යුදකාමය සමග ප්‍රසිද්ධ බැට දීමක නිරතවෙමිනි.

දෙරට අතර මිලිටරි ආතතීන්ගේ ප්‍රධාන උත්සන්නියක පසුබිම අභිමුවෙහි, *ටයිම්ස්* පත්‍රය සති අන්තයේ රුසියානු ජාතිකයින්ට එරෙහි අධිකරන දෙපාර්තමේන්තුවේ අධිචෝදනාව ඩැහ ගත්තේ, එක්සත් ජනපදය සමග රුසියාව "යුද්ධයක" නියලෙන බව ප්‍රකාශ කිරීමට ය. දැන්, ඇමරිකාව තුල මැතම ජන ඝාතනය සම්බන්ධ සමාජ බෙදීම් සඳහා කෙසේ නමුත් රුසියාව වග කිව යුතු බවට වන තර්කයක් දක්වා *ටයිම්ස්* මෙම ප්‍රකාශය පුලුල් කර ඇත.

අඟහරුවාදා එහි ප්‍රධාන ශීර්ෂපාඨය මෙසේ ය: "වෙඩි තියලා, තව ද කීටයෝ (පරිගනක රොබෝවන්) සමාජ බෙදීම්වලට රංචු ගැසෙති - ෆ්ලොරිඩා පාසල් වෙඩි තැබීම කැඳවන්නේ විසම්මුතිය පැතිරවීමට සූදානම් හමුදාවකි."

*ටයිම්ස්* පත්‍රයට අනුව, රුසියානු "කීටයන්" නැතහොත් ස්වයංක්‍රීය සමාජ මාධ්‍ය ගිනුම්, තුවක්කු පාලන හා මනෝ ව්‍යාධියේ ප්‍රශ්න මත "බෙදීම පුලුල් කිරීමට" උත්සාහ ගන්නේ "සම්මුතියක් ඇති කිරීම වඩාත් අපහසු කරවනු" පිනිස ය. "තුවක්කු පාලනය කිරීමේ විවාදය තුල මනෝ ව්‍යාධිය පිලිබඳ ප්‍රශ්න" ගසා කෑමට රුසියාව උත්සාහ කල අතර "නිකොලස් කෲස්, නම් සැකකාර තුවක්කුකරු, මනෝ ව්‍යාධියෙකු ය යන මතය ව්‍යාප්ත කලේ ය."

ඇමරිකාව තුල සමාජ බෙදීම්වල පැවත්මට රුසියාව වග කිව යුතු ය යන විකාර ප්‍රකාශය වෙඩි තැබීමෙන් ම බොරු කෙරේ, වෙඩි තැබීම ප්‍රගතිශීලි පිටවීමේ මාර්ගයක් නැති තැන, මහජන ප්‍රචන්ඩත්වයේ අධික පිටාර යාම තුල ඒවාම ප්‍රකාශ වන එදිරිවාදිකම්වලින් ඇමරිකානු සමාජය ඉරා දැමෙන්නේ ය යන කාරනයට සාක්ෂියකි.

මෙම උද්ඝෝෂනයේ අරමුන වෙඩි තැබීම යටින් පවතින සමාජ හේතු, (සමූහ වෙඩි තැබීම්වල නැගීම ඇති කරන, ඇමරිකානු සමාජයේ ප්‍රචන්ඩතා, මනෝ ව්‍යාධි හෝ සමාජ මනෝවිද්‍යා සේවාවක් හෝ නැතිකම) විවේචනය කිරීමට ඉඩ ඇති ඕනෑම අයෙකු ඇමරිකානු සමාජය තුල "බෙදීම් වැපිරීමට" උත්සාහ කරන "රුසියානු ඒජන්තයෙකු" ලෙස ගොදුරු කර ගැනීම යි.

*ටයිම්ස්* ප්‍රධාන ලිපිය මුලුමනින් ම පදනම් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වන ජර්මානු මාර්ෂල් අරමුදලේ සන්ධානය විසින් නිර්මානය කෙරුනු හැමිල්ටන් 68 නම් "උපකරන පුවරුව" (dashboard) මත ය. එහි ප්‍රධාන කථිකයා වන්නේ, එක්සත් ජනපද ඔත්තු සේවා ඒජන්තයෙක් වූ හා කප්පාදු උපදේශකයෙකු වූ ක්ලින්ට් වට්ස් ය, සමාජ මාධ්‍ය සමාගම් "කැරලිකාර" මූලාශ්‍රයන් "නිහඬ" කල යුතු යැයි ඔහු පසු ගිය නොවැම්බරයේ දී ප්‍රකාශ කලේ ය.

එය ලුහුබඳින ගිනුම්වලින් එකක් හෝ නම් නො කර, හැමිල්ටන් 68 "රුසියානු බොට්ස් හා ට්‍රොල්ස් යන පරිගනක රෝබෝවන්" විසින් ට්විටර් කෙරෙන අන්තර්ගතයන් හඹා යන බව පවස යි. "උපකරන පුවරුව" මෙහෙයවන ප්‍රවනතා බොහොමයක්, *රුසියා ටුඩේ* හා *ස්පුට්නික් නිව්ස්* විසින් විසුරුවන ප්‍රවෘත්ති ආඛ්‍යානයෝ ය. ඒවා වෙනත් ඕනෑ ම ඒජන්සියක් විසින් හඹා යනු ලබන අභිනති මාතෘකාවලට සමාන ය. මෙලෙස, හැමිල්ටන් 68 *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයට ක්ෂනික ශීර්ෂපාඨ උත්පාදකයක් සපය යි: ඕනෑ ම ප්‍රධාන ප්‍රවෘත්ති ආඛ්‍යානයක් "රුසියානු කීටයන්ගේ" ප්‍රතිඵලයක් ලෙස ඉදිරිපත් කල හැක.

"රුසියානු ඇඟිලි ගැසීම" ගැන *නිව්යෝක් ටයිම්ස්* තම ප්‍රකාශ කරමින් සිටින්නේ නීතිය තුල "අපරාධකාරී හස්ථ" නමින් ප්‍රසිද්ධ දෙය සමගිනි. එනම්, *ටයිම්ස්* අනුගමනය කරන්නේ ඔවුන් අනුන්ට චෝදනා කරන දෙයම ය.

ලතින් ඇමරිකාව හා මැද පෙරදිග අස්ථාවර කිරීමේ ඇමරිකානු උද්ඝෝෂනයන්ගේ දීර්ග මෙන් ම ලේ වැකි ඉතිහාසය හා ඒවායේ දරුනු ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමට හෝ විදේශයන් හි සේවය කරන බොහෝ ඇමරිකානු මාධ්‍යවේදීන්ට, වාර්තාකරුවන් ලෙස හා ඒජන්තයන් ලෙස ද්විත්ව කාර්යයන් ඇතැ යි යන කරනු විමර්ශනයට හෝ මෙය අවස්ථාව නො වේ.

විශේෂයෙන් ම මෑත දශකවල දී, කර්තෘ පිටු සංස්කාරක ජේම්ස් බැනන්ගේ අනුග්‍රහය යටතේ එක්සත් ජනපද ඔත්තුසේවා ඒජන්සිවල ප්‍රධාන මෙහෙයුම් සමග *ටයිම්ස්* පත්‍රයේ කැපී පෙනෙන සමෝධානයක් තිබී ඇත.

රුසියාව සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් ම සත්‍ය ය, ඒ සම්බන්ධයෙන් ගත් විට, *ටයිම්ස්* අනුගමනය කරන්නේ එය හරියට ම ක්‍රෙම්ලිනයට චෝදනා කරන දෙය ක්‍රියාත්මක කරමින්, රුසියානු විදේශ ප්‍රතිපත්ති පිලිබඳ වැරදි තොරතුරු සැපයීමේ උපකරනයක් ලෙස ය.

උදාහරන වසයෙන්, ඊනියා දේශපාලන "විසම්මුතිකයෙක්" වන ඇලෙක්සෙයි නවල්නි ගනිමු. රුසියාවේ ෆැසිස්ට්වාදී දක්ෂිනාංශයට දැඩි සම්බන්ධකම් මෙන් ම එක්සත් ජනපද ඔත්තුසේවා ඒජන්සිවලට විශාල සම්බන්ධකම් සහිත ව, අන්ත ජාතිකවාදය හා විදේශික භීතිකාවේ මෙම යෝජකයා, *ටයිම්ස්* විසින් වීරත්වයට නැංවී ඇත්තේ රුසියාවේ සමාජ විසම්මුතියේ හඬ ලෙස ය. රුසියාව තුල ඔහුට ඇති ඉතා

කුඩා සහයෝගය නො තකා, නවල්නිගේ ක්‍රියාකාරකම් *ටයිම්ස්* මුල් පිටුවේ ශීර්ෂපාඨ උත්පාදනය කර යි, *ටයිම්ස්* එකිනෙකට වෙනස් ලිපි 400ක් තුල ඔහු ගැන සඳහන් කර ඇත.

තවත් උදාහරනයක් වන්නේ රුසියානු චිරස්ථාපිත පල්ලිවල දී ඔවුන්ගේ ඇඳි වත ගැලවීමෙන් තෙමේ ම අත්අඩංගුවට පත්වෙන චර්යාවක් ඇති කරන "ස්ත්‍රීවාදී" රොක් සංගීත කන්ඩායමක් වන පුසී රයට් *ටයිම්ස්* පත්‍රය විසින් පිම්බීම යි, ඔවුන්ගේ ඉරනම රුසියානු මර්දනයේ බියකරු උදාහරනයක් ලෙස *ටයිම්ස්* පත්‍රය විසින් ඉහලට ඔසවනු ලබ යි. නියමානුකුල භාවිතයේ දී රුසියානු භාෂාවට පවා පරිවර්තනය කෙරී නැති "පුසී රයට්" යන නම ම ද ප්‍රකාශ කරන්නේ මෙම මෙහෙයුම අරමුනු කරන්නේ ඇමරිකානුවන්ට බලපෑම මිස, රුසියානු මහජන අදහසට බලපෑම නො වේ යන කාරනය යි.

2014දී, තම කර්තෘ මන්ඩල කාර්යාලයේ දී *ටයිම්ස්* පත්‍රය පුසී රයට් කන්ඩායම සමග හමු වූ අතර, එතැන් සිට, ලිපි 400ට වඩා වැඩි සංඛ්‍යාවක සඳහන් කරමින් පුලුල් ලෙස මෙම කන්ඩායම ප්‍රචාරය කෙරී ඇත. "පුටින් විරෝධී විරුද්ධ පාර්ශ්වය" යන වචනය තවත් ලිපි 600ක සඳහන් කෙරේ.

*ටයිම්ස්* උද්ඝෝෂනයේ තර්කය බොහෝ පැහැදිලිව ප්‍රකාශ කරනු ලබන්නේ එහි තීරු ලිපි රචක තෝමස් ෆ්‍රීඩ්මාන් විසිනි, රාජ්‍ය ඔත්තුසේවා හොරනෑ විසින් පන්ඩිතයෙකු ලෙස පුද්ගලාරෝපනය කෙරෙන ඔහුගේ වෘත්තිය දක්ෂ ලෙස සාරාංශ කෙරෙන්නේ රාජකීය දූතයා (Imperial Messenger) නම් චරිතාපදානය තුල ය. පෙබරවාරි 18වැනිදා ප්‍රසිද්ධ කෙරුනු තීරු ලිපියක ("ට්‍රම්ප් මොනවා වසන් කරමින් සිටියත් දැන් එක්සත් ජනපදයේ සියල්ලට රිදවමින් සිටී") ෆ්‍රීඩ්මාන් ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ "කේත රක්ත" (දැඩි අනතුරක) තර්ජනයක් ප්‍රකාශ කර යි.

"එෆ්බීඅයි, සීඅයිඒ හා එන්එස්ඒ විසින් වසර ගනනාවක් කරන ලද ඔත්තුසේවා රැස් කිරීම් ඉහලට ඔසවමින්, විශේෂ අභිචෝදක රොබට් මුලර්, 2016 එක්සත් ජනපද මැතිවරනය තුල මැදිහත්වීම වෙනුවෙන්, රුසියානු ජාතිකයින් 13කුට හා රුසියානු කන්ඩායම් 3කට (සියලු දෙනාම යම් ආකාරයකින් ක්‍රෙම්ලිනයට සම්බන්ධ) එරෙහිව අධිචෝදනා ගෙන විත් ඇති අවස්ථාවක, ඇමරිකාවට අවශ්‍ය වන්නේ අපගේ ඡන්දදායක ප්‍රජාතන්ත්‍රවාදයේ ඒකාබද්ධතාව මත ප්‍රහාරයට එරෙහිව අපගේ ජාතියේ ආරක්ෂාව මෙහෙයවනු ඇති ජනාධිපතිවරයෙකි" යි ෆ්‍රීඩ්මාන් ලිය යි.

ෆ්‍රීඩ්මාන්ට අනුව, මෙම "ආරක්ෂාවට" ඇතුලත් වනු ඇත්තේ "පුටින්ට එරෙහිව ඵලදායි ප්‍රහාරයක් ගොඩ නැගීමට අපගේ ඔත්තු සේවා හා මිලිටරි විශේෂඥයින් එකට ගෙන ඒම (සියල්ලෙන් ම හොඳ ම ආරක්ෂාවයි ඒ)". වෙනත් වචනවලින් කිවහොත්, ඒ යුද්ධය යි.

සියලු යුද ප්‍රචාරයන්ගේ කර්තව්‍යය වන්නේ අභ්‍යන්තර සමාජ ආතතීන් පිටතට හැරවීමයි, එමෙන් ම *ටයිම්ස්* උද්ඝෝෂනය ඊට වෙනස් නැත. එහි ඉලක්කය වන්නේ සමාජ අසමනාතාව, මහජන පිටස්තර භාවය, පොලිස් ප්‍රචන්ඩත්වය හා අවසානයක් නැති යුද්ධවලින් ඇලලුනු සමාජයක මිලියන ගනනාවක් පුද්ගලයන් විඳින කෝපය ඉවත හරවා, යම් සැක සහිත විදේශ විරුද්ධකාරයෙකු මත ඇමිනීම යි.

පාක්ලෑන්ඩ් වෙඩි තැබීම තුල රුසියානු "ඇඟිලි ගැසීම්" පිලිබඳ *නිව් යෝක් ටයිම්ස්* ප්‍රකාශ සන්ධ්‍යා ප්‍රවෘත්ති විකාශනවල දී ඊටත් වඩා නරුම ආවරනයකට හඬ සකස් කලේ ය. හැමිල්ටන් 68 තවත් හවුල්කරුවෙකු වන, ජොනතන් මෝගන් මෙසේ පැවසූ බව එන්බීසී ප්‍රවෘත්ති සේවාව සඳහන් කලේ ය, රුසියාව "ඇමරිකානුවන් අතර අසහනය පැතිර වීමට සැබවින් ම උත්සුක වෙති. ඒ ආකාරයෙන් විදේශීය එදිරිවාදීන්ට පහර දීමට එක්සත් පෙරමුනක් ඇති කිරීම ගැන අප අවධානය යොමු කර නැත."

පාලක පන්තිය හා එහි මාධ්‍ය හවුල්කරුවන්ගේ අරමුන එක්සත් ජනපදය තුල සමාජ විරුද්ධත්වය මර්දනය කිරීම හරහා "ඒකාබද්ධ පෙරමුනක්" ඇටවීම යි. මෙම රේඛා ඔස්සේ, *එන්බීසී ප්‍රවෘත්ති* සේවය මෙසේ ද පැවසී ය, "සමාජ මාධ්‍ය මත මෙම ප්‍රහාරයන් රඳවනු ලබන්නේ හුදෙක් රුසියාව විසින් පමනක් නොව, බොහෝ කුඩා කන්ඩායම් ඇමරිකානුවන් බෙදීමටත් ව්‍යාකුලතා ඇති කිරීමටත් උත්සාහ කරමින් සිටින බව පර්යේෂකයෝ අපට පවසති."

"අරාජකත්වය නිර්මානය කිරීමට" උත්සාහ කරමින් සිටින මෙම "ස්වාධීන කුඩා කන්ඩායම්" මොනවා ද? මේ මගින්, ඔවුන් අර්ථවත් කරන්නේ ඇමරිකාව තුල සෑම දෙය ම යහපත් ය යන නිල පිලිවෙත ප්‍රශ්න කිරීමට නිර්භීත වන්නා වූ ද, ඇමරිකානු සමාජය හාත්පස පැතිරෙන ප්‍රචන්ඩතාවන්ගේ බියකරු මට්ටම කෙසේ නමුත් සමස්ත එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය විසින් සහාය දෙනු ලබන මෙන් ම යුක්තිසහගත කෙරෙන සමාජ අසමානතාවට සම්බන්ධ බවට තර්ක කරන්නා වූ ද ඕනෑ ම ප්‍රවෘත්තියක් හෝ දේශපාලන සංවිධානයක් බවට සැකයක් නොමැත.

1999 කොලොම්බියන් උසස් පාසලේ සංහාරය විදේශයන් හි එක්සත් ජනපද යුද්ධවලට සම්බන්ධ කල, *බෝලින් ෆෝර් කොලම්බියාන්* නම් චිත්‍රපටයේ අධ්‍යක්ෂ මයිකල් මුවර්, චෝදනා කෙරෙන පරදි රුසියාව විසින් සංවිධානය කෙරුනු ට්‍රම්ප් විරෝධී පෙලපාලියකට සහභාගී වී ඇත යි චෝදනා කරමින් *ෆොක්ස් නිව්ස්* කතන්දරයක් විසුරුවා හැරි දිනයේ දී ම මෙම ප්‍රකාශ කෙරුනු බව සටහන් කිරීම වැදගත් ය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* යලි යලිත් අනතුරු අඟවා ඇති පරිදි, මෙම උද්ඝෝෂනයේ ඉලක්ක වනුයේ යුද විරෝධී හා ප්‍රගතිශීලී වෙබ් අඩවි, දේශපාලන සංවිධාන, හා ප්‍රවෘත්ති විකාශන, මෙන් ම තව දුරටත් විස්තාරනය කිරීම මගින් මුලුමහත් ඇමරිකානු මහජනතාවගේ මාධ්‍ය නිදහස හා ප්‍රකාශනයේ නිදහස යි. "විදේශ විරුද්ධවාදීන්ට" එරෙහිව "ඒකාබද්ධ පෙරමුනක්" නාමයෙන් කොන්දේසි නිර්මානය කෙරෙමින් පවතින්නේ දේශපාලන විසම්මුතිය අපරාධිකරනය හා තහනම් කිරීම සඳහා ය.

ආන්ද්‍රේ ඩමොන්

© www.wsws.org